# සතුරන් මිතුරන් සහ නිදහස




හමා යන මද සුළඟට දෙපසට නැළවෙන තුරු මුදුනකට වී අවට සිරි නරඹමින් හුන් කපුටෙක් දුටු එක් හාවෙකුට කිසිම වැඩක් නොකර එම කපුටා මෙන් කල් ගත කළ හැකිනම් කෙතරම් අගේ දැයි සිතිණ. එසේ සිතූ හාවා තුරු මුඳුනේ සිටි කපුටා අමතා මෙසේ කීය. "මමත් ඔහේ වගේ කිසිම දෙයක් නොකර දවස ගත කරන්න කැමතියි." ඒ ඇසූ කපුටා හාවාට පිළිතුරු වශයෙන් කීවේ "උඹ කැමති නම් ගහ මුළට වෙලා කිසිම දෙයක් නොකර ඉඳපන්". කාක්කාගේ පිළිතුරෙන් ප්‍රීතියට පත් හාවා ගස මුළ හාන්සි වී අහස බලාගෙන සිටිනු දුටු එක් හිවලෙක් පැමිණ වැඩි කරදරයක් නැතිවම හාවා මරාගෙන කෑවේය.

මේ අතර ශීත ඍතුවේ සීතලෙන් මුසපත්ව සිටි කුඩා කුරුල්ලෙක් තැන තැන ඇවිදිමින් සිටියේ කෑමට කිසිවක් සොයමිනි. දැඩි සීතලෙන් අසරණව සිටි මේ කුඩා කුරුල්ලාගේ ඇඟ මතට අනපේක්ෂිත ලෙස ගවයෙක් ගොම පිඩක් හෙළීය. සිදුවූ දෙයින් අන්ද මන්ද වූ නමුත් ගොම ගොඩ යට සිරවූ කුරුල්ලාට සීතල කපාගෙන යන සුවදායක උණුසුමක් දැනිණ. වසුරු ගොඩට යට වී වුවද ලද සුවයෙන් ප්‍රීතියට පත් කුරුල්ලා ගීතයක් ගැයීමට පටන් ගත්තේය. මේ අතර ඒ අසළින් කෑම සොයමින් යමින් සිටි බළලෙකුට මේ අමුතු ගී නාදය ඇසී ගොම ගොඩ අවුස්සා බැලීමට සිත් විය. නැවුම් ගොම ගොඩේ උණුසුමින් මත්ව සිටි කුරුල්ලා කිසිම කරදරයක් නැතිවම තම ආහාරය බවට පත් කර ගැනීමට බළලාටද හැකි විය.

ඉතා මෑතකදී මට අසන්නට ලැබුණු මේ පුංචි කථා දෙක ඊසෝප්ගේ හෝ නසුරුදීන්ගේ හෝ වෙනත් උපමා කථාවක්දැයි නොදනිමි. එහෙත් ඉන් කියවුණු ආදර්ශයන් බොහෝ කාලයක් මතකයේ රැඳෙන සුළුය. මෙහි සඳහන් පළමු කථාවෙන් ගත යුතු ආදර්ශය වන්නේ කවරෙකුට හෝ කිසිවක් නොකර නිදහසේ ජීවිතය ගත කිරීමට අවශ්‍ය නම් ඔහු සිටිය යුත්තේ ඉතා ඉහළ තැනක බවය.

දෙවෙනි කථාවෙන් ගත හැකි ආදර්ශය වන්නේ කෙනෙකුගේ හිස මතට කුණු කසළ හෙළන සියලු දෙනාම ඔහුගේ හතුරන් නොවන බවයි. එසේම කිසියම් කෙනෙකුට තමන් වැටී සිටින නරා වළකින් ගොඩට ඒමට උදව් කරන්නා වූ සියල්ලෝම එම තැනැත්තාගේ මිතුරන්ද නොවන බවයි. කිසියම් කාලයක කිසියම් කෙනෙකුගේ හිස මත බොහෝ කුණු කන්දල්, ප්‍රශ්න බාධක ඇත්නම් ඔහු කළ යුතුව ඇත්තේ මදක් කට ප්‍රවේසම් කර ගැනීමය.


සාමන්ත තැන්නගේ







# මුහුණට මුහුණ



ශ්‍රීනාත් මද්දුමගේ

මෙල්බන් සිංහල ගුවන් විදුලි සේවා අතර වසර ගණනාවක් එකම අයුරින් ජන හද දිනාගත් 'වොයිස් ඔෆ් ලංකා'' ඔබ වෙත ගෙන එන රංජිත් සහ රූබි වික්‍රමසිංහ යුවල සමග ඔවුන්ගේ මෙම සාර්ථක ගමන පිළිබඳව සාකච්ඡා කරන්නට අපට පසුගිය දා අවස්ථාව ලැබුණා. මේ සාකච්ඡාවට හේතු වූයේ වසර ගණනාවක් එක දිගට ගුවන් විදුලි වැඩසටහනක් මෙහයවීම නිසාවෙන්.

සන්නස
ඔබේ ගුවන් විදුලි වැඩ සටහන ආරම්භ කර දැන් කොපමණ කල් ද?

රංජිත්
කියන්න සතුටුයි මේ අවුරුද්දෙ මැයි 22 දාට අවුරුදු 15 ක් සපිරෙනවා. මම හිතනවා මෙපමණ දීර්ඝ කාලයක් අඹු සැමි යුවලක් එක දිගට පවත්වාගෙන ආ වෙනත් ගුවන් විදුලි සේවාවක් නැතැයි කියලා. මෙය ලෝක වාර්තාවක්.

සන්නස
මේ වාර්තාව ගිනස් ලෝක වාර්තා පොතට ගෙනයන්න කල්පනාවක් නැද්ද?

රංජිත්
මේ වෙනකොට මගේ හිතවත් අය ඒ සඳහා වැඩ කටයුතු කරමින් යනවා. සමහර විට ඉදිරියේදී මෙය ගිනස් පොතට යා හැකියි. මෙය ලෝක වාර්තාවක් ද නැද්ද යන වග ඒ අය තීරණය කරාවි.

සන්නස
මෙපමණ කාලයක් ගුවන් විදුලියක් සාර්ථකව ගෙන යන්න හැකි වුණ මූලික කාරණාව මොකක්ද?




## රංජිත් රූබි ගිනස් පොතට...?

රංජිත්
මම හිතන්නෙ මගේ ගුවන් විදුලියත් හරියට අපේ පවුල වගේ. ඒකට හේතුව තමයි මාත් මගේ බිරිඳත් මගේ දරුවනුත් මේකට සම්බන්ධ වීම. ඒනිසා මේකත් අපේ පවුලේ කටයුත්තක්ම තමයි. හැල හැප්පීම් නොගැලපීම් අපි අතර නැහැ. අපි දන්නවා මොන තරම් හිතවත් යාලු මිත්‍රයන් වුණත් එකට වැඩක් කරණකොට පුදුමාකාර ලෙස වෙනස් වෙනවා. සමහරු බලෙන් නායකත්වය ගන්න හදනවා. මේක කණ්ඩායම් වැඩක් කියන එක අමතක කර තමන් මුදුණා වෙන්න හදනවා. තමන්ට මෙය කරන්නට හැකියාවක් හා දක්ෂ කමක් තියෙනවාද කියන එකවත් තේරුම් ගන්නෙ නැතිව සමාජය ඉදිරියේ විහිලුවට ලක්වෙනවා.

සන්නස
ඔබ මෙහෙම කියන්නෙ ඒ වගේ අත්දැකීම් ඔබට ලැබී තිබෙනවද?

රංජිත්
ඔව්.. මට හුඟක් අත්දැකීම් තිබෙනවා.. මොකද මම මේ වොයිස් ඔෆ් ලංකා පටන් ගන්නට පෙර මෙල්බන් ගුවන් විදුලි සේවා කීපයකම වැඩ කර ලබා ගත් අත්දැකීම් තියෙනවා. එවැනි මිනිසුන්ගේ වැඩ වලින් ඇතිවුණ කළ කිරීම් නිසයි පවුලේ අයත් සමග මේ ගුවන් විදුලිය ආරම්භ කළේ.

සන්නස
මේ ගුවන් විදුලිය ආරම්භ කළ හැටි කියන්න

රංජිත්
මුලින්ම අපි මේ වැඩ සටහන ආරම්භ කළේ පැය බාගයකින්. සාර්ථකත්වය නිසා ඊට පසුව පැය දෙක දක්වා දීර්ඝ වුණා. දැන් සෑම ඉරිදාවකම රාත්‍රි 8 සිට 11 දක්වා පැය තුනක කාලයක් විකාශණය වෙනවා.

සන්නස
ඔබට ලැබෙන ප්‍රේක්ෂක ප්‍රතිචාර එහෙම කොහාමද?

රංජිත්
ඉතාමත්ම ඉහළයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවෙන් පැමිණෙන හැම කලාකරුවෙක්ම මේ අවුරුදු 15 තුළ අපේ මැදිරියට ගොඩ වී තිබෙනවා. මෙයට අමතරව කලාවට ආදරය කරන හුඟ දෙනෙක් අපේ වැඩසටහන් වලට සහභාගි වී තිබෙනවා. අපේ ගුවන් විදුලියේ දොරවල් හැම විටම හැම දෙනාටම විවෘත වෙලා තියෙන්නෙ. ඒ වගේම මෙයට සවන් දෙන ප්‍රේකශකයන්ගෙන් අපට ලැබෙන දිරිය ඉතාමත් ප්‍රසංශනීයයි. ප්‍රේක්ෂකයන් නැති නම් අපි මොනවා කළත් වැඩක් නැහැ. මට කියන්න සතුටුයි මෙය පටන් ගත් දා සිට සිටින ප්‍රේක්ශකයන් අදත් අප සමග සිටිනවා. මම ඒ අයට ස්තුති කරන්න මෙය අවස්ථාවක් කරගන්නවා.

සන්නස
ඔබේ ගුවන් විදුලිය හඳන්වා දෙන්න කැමති කොයි විදිහට ද?

රංජිත්
මම හිතන්නෙ අපි කරන මේ සම්ප්‍රදාය අපටම ආවේනිකයි. වෙන කොහේවත් නැහැ. ඒ බව මෙය අසන ප්‍රේක්ෂකයන් හොඳින් දන්නවා. අපි අපටම ආවිනික සරළ ශෛලියකින් මෙය ඉදිරිපත් කරනවා. ඒ වගේම මෙම වැඩ සටහනේ විකාශණය වන වෙළඳ දැන්වීම් පවා අප විසින්ම නිර්මාණක කළ ඒවා. එසේම අපටම කියා තාක්ෂණ මැදියකුත් තිබෙනවා. අපේ පටිගත කිරීම් සියල්ලම සිදුකරන්නෙ අපේම ශබ්දාගාරයේදීයි. තවත් කියන්න කාරණයක් තිබෙනවා. මා සතුව අති විශාල ගීත එකතුවක් තිබෙනවා. ගණන් බැලුවොත් 18000 ක් පමණ. 1947 සිට මෑතක් වන තෙක් බිහිවුණ ගීත රාශියක් මා ළඟ තිබෙනවා. පැරණි තැටි අලුතින් බිහිවුණ සංගත තැටි දෙදාහක් පමණ තිබෙනවා. ඒනිසා ඕනෑම ශ්‍රාවකයෙක් ඉල්ලන ගීතයක් අපට ලබා දෙන්න පුලුවන්.

**සමහරු බලෙන් නායකත්වය ගන්න හදනවා. මේක කණ්ඩායම් වැඩක් කියන එක අමතක කර තමන් මුදුණා වෙන්න හදනවා. තමන්ට මෙය කරන්නට හැකියාවක් හා දක්ෂ කමක් තියෙනවාද කියන එකවත් තේරුම් ගන්නෙ නැතිව සමාජය ඉදිරියේ විහිලුවට ලක්වෙනවා.**

සන්නස
ඔබේ පවුලේ විස්තර කිව්වොත්

රංජිත්
මගේ බිරිඳ මගේ සෙවණැල්ල වගේ මා ළඟ සිටිනවා. ඒ වගේම මගේ පුතුන් දෙදෙනා රැක්ෂාන් සහ රුමේෂ් මා සමග ඉන්නවා. ඔවුන් දෙදෙනාත් සංගිතයට හපන් කම් කියන අය. ඔවුන්ගේ සංගීත කණ්ඩායමක් පවා තිබෙනවා. Rendezvouf එහි නමයි.

අපේ අසන්නන්ගෙන් අප ඉල්ලා සිටිනවා මේ තාක් කාලයක් අපට ලබා දුන සහයෝගය ඉදිරියටත් නොඅඩුව ලබා දෙන ලෙසට. අපේ සාර්ථකත්වය පිටුපස ඉන්නෙ ඔබයි.

ලොවේ කොතැන සිටියත් ඔබටත් www.3ser.org.au ඔස්සේ රංජිත් සහ රූබි ගෙන එන 'වොයිස් ඔෆ් ලංකා' ගුවන් විදුලියට සවන් දෙන්න පුලුවන්. ඔවුන් දෙදෙනාගේ මේ සුන්දර ගුවන් විදුලිය තව බොහෝ කාලයක් පවත්වගේන යන්නට හැකියාව හා ශක්තිය ලැබෙවායි සන්නස සුබ පතනවා.

**ජගත් එදිරිසිංහ රචිත ගංම්හාන සුළඟ සහ අසුර අඩවිය යන නවකතා ද්විත්වය ඕස්ට්‍රේලියාවේදී දොරට වැඩීම සැප්තැම්බර් 14 වෙනි දින බ්‍රෝච්මැඩෝස්හි හියුම් පුස්තකාලයේදී සිදුවේ.**